පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79
ආයතනයේ නම: විදේශ කටයුතු අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 79
நிறுவனத்தின் பெயர்: வெளிநாட்டு அலுவல்கள் அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்

Parliamentary Series No: 79
Name of the Institution: Ministry of Foreign Affairs

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා : අංක 79
ආයතනයේ නම : විදේශ කටයුතු අමාත්‍යාංශය

<u>පළමුවන කොටස: 75.00</u>

	කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු සඳහා පැහැදිලි කිරීම සහ අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
01.	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර, පවත්වාගෙන ගොස් නොතිබුණි.	මෙම අමාත්‍යාංශයේ මුදල් අංශය විසින් සාමාන්‍ය පරිපාලන අංශය සහ විදේශ වත්කම් කළමණාකරන සහ සංවර්ධන අංශය (OAM&D) විසින් සපයනු ලබන තොරතුරු මත පදනම්ව කපා හැරීමට අදාළ හානි පිළිබඳ ලේඛනය පවත්වාගෙන යයි. වාර්තාගත වූ අලාභ ලේඛනගත කර ඇති අතර ලේඛනය යාවත්කාල කරමින් පවත්වාගෙන යයි **(ඇමුණුම 1 සහ 2).** තවද, වහාම ක්‍රියාන්මක වන පරිදි පොදු ලෙජරයේ නැතිවූ අයිතම පිළිබඳ සියලු විස්තර සම්පාදනය කිරීමට පියවර ගෙන ඇත.
02.	අවදානම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන පදනමින් පවත්වා ගෙන ගොස් නැත.	අවදානම් පිළිබඳ ලේඛනය සකස් කර ඇත. කෙසේ වෙතත්, සන්නිවේදන දෝෂයක් හේතුවෙන් එය "නැත" ලෙස සටහන් කර ඇති බව නිරීක්ෂණය විය. **(ඇමුණුම 3)** අවදානම් පිළිබඳ ලේඛනය අදාළ නිලධාරීන්ට ඉදිරිපත් කරන ලදී.
03.	විගණන විමසුම් ලැබී මාසයක් ඇතුළත විගණකාධිපතිවරයාගේ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු එවා තිබුණේ නැත.	විදේශ දූත මණ්ඩලවලින් තොරතුරු රැස් කිරීමට තිබෙ. බොහෝ අවස්ථාවන්වලදී සාමාන්‍යයෙන් තොරතුරු රැස්කිරීමේදී ප්‍රමාදයන් සිදුවේ. කෙසේ වෙතත්, අමාත්‍යාංශයේ පැවති විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලදී මේ කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබේ. දැනට, විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළත ප්‍රතිචාර දැක්වීමට හෝ මාසයක් ඇතුළත අතුරු පිළිතුරක් (interim reply) යොමු කිරීමට හෝ වැඩිපුර කාලයක් සඳහා කාලය දිගු කරන ලෙස ඉල්ලා සිටීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.
04.	අවශ්‍ය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව වසරක් පාසා පවත්ව නොතිබුණි.	රටතුළ පැවති නොසන්සුන්කාරී තත්ත්වය හේතුවෙන්; 2022 වසර සඳහා නියමිතව තිබූ රැස්වීම් හතරම පැවැත්වීමට අමාත්‍යාංශයට නොහැකි විය. කෙසේ වෙතත්, 2023 වසරේදී රැස්වීම් තුනක් පවත්වා ඇති අතර, 2024 දී චක්‍රලේඛ අවශ්‍යතාවට අනුව රැස්වීම් කැඳවීමට කටයුතු සැලසුම් කර තිබේ.
05.	සියලුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි	අමාත්‍යාංශයේ වාහන සංචිතයේ ඇති සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කළ පුවරුවක් ප්‍රදර්ශනය කෙරේ.

06.	මූල්‍ය රෙගුලාසිවලට අනුව රජය සතු මෝටර් රථවලට සිදුවන අනතුරු සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.	2022 වසරේදී වාහන අනතුරු 11ක් සිදුවී ඇති අතර (ශ්‍රී ලංකාවේ පමණක්) ඊට අදාළ සම්පූර්ණ අලුත්වැඩියා වියදම් රක්ෂණ සමාගම්වලින් අය කර ඇත. අදාළ වාර්තාවලට අනුව, ශ්‍රී ලංකාවේ විදේශ ධූත මණ්ඩල/කාර්යාල මගින් අමාත්‍යාංශයේ විදේශීය පරිපාලන හා දූත මණ්ඩල කළමනාකරණ අංශය වෙත වාර්තා කළ ඕනෑම විදේශ අනතුරක් සඳහා කටයුතු සිදු කර ඇති අතර මූල්‍ය රෙගුලාසි සහ සත්කාරක රටේ රෙගුලාසිවලට අනුව පියවර ගෙන ඇත.
07.	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර, සහතික කර සහ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	අමාත්‍යාංශයේ බැංකු ගිණුම් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් ඇතැම් ප්‍රමාදයන් වාර්තා වී ඇත. මීට අමතරව, සෑම මසකටම පෙරාතු දින 15 ක කාලය තුළ විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාල 61 න් හෞතික බැංකු සැසඳුම් ලේඛන ලබා ගැනීම ද සැලකිය යුතු ප්‍රමාදයකට හේතු වී ඇත. i.e. - විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල/කාර්යාලවලින් මුල් ලේඛන ලැබීමේ ප්‍රමාදය. කෙසේ වෙතත්, අමාත්‍යාංශයේ බැංකු සැසඳුම් මූල්‍ය රෙගුලාසි අනුව සෑම මාසයකම යොමු කරනු ලැබේ. ඒ අනුව 2024 ජූනි මාසය සඳහා වන බැංකු සැසඳුම් ප්‍රකාශය මේ වන විටත් යොමු කර ඇත. **(ඇමුණුම 4).** සිය බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට විදුහුත් තැපෑල හරහා යොමු කරන ලෙස සියලුම දූත මණ්ඩල/කාර්යාලවලට උපදෙස් නිකුත් කර ඇත. **(ඇමුණුම 5)**
08.	සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂයේ සිට එන අක්‍රිය ගිණුම් නිරවුල් කර නොතිබුණි.	අමාත්‍යාංශයේ පාලනයෙන් ඔබ්බට ගිය සාධක හේතුවෙන් පහත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල අක්‍රිය ගිණුම් කිහිපයක් ඉතිරිව පවතී. **දූත මණ්ඩලය** / **අක්‍රිය ගිණුම් පැවැතීමට හේතුව** කාබුල් / මේ වන විට ශ්‍රී ලංකාව කිසිදු රාජ්‍යතාන්ත්‍රික සබඳතාවක නිරත නොවීම ටෙහෙරාන් / ආර්ථික සම්බාධක සහ අනෙකුත් සීමා සහිත රෙගුලාසි පැනවීම අබුජා / ප්‍රතීතනය ලත් නයිරෝබි දූත මණ්ඩලය වසා දැමීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී අදාළ විදේශ දූත මණ්ඩලවල උපදෙස් පරිදි අක්‍රිය ගිණුම් වසා දැමීමට ක්‍රියා කර ඇත **(ඇමුණුම 6).**
09.	බැංකු සැසඳුම් ප්‍රකාශවල සොයාගැනීම් මගින් අනාවරණය වන සහ සකස් කළ යුතු ශේෂයන් මූල්‍ය රෙගුලාසිවලට අනුව මාසයක කාලයක් තුළ සකස් කර නොතිබුණි.	හඳුනා නොගත් ගෙවීම් සහ විශේෂිත පාර්ශවයන් සහ බැංකු මගින් ලබා දෙන ලදුපත් සම්බන්දයෙන් අදාළ නොරතුරු රැස් කිරීමට ගතවන කාලය හේතුවෙන්, අදාළ නොරතුරු ඉල්ලා තිබුණත් සැකසුම් ප්‍රවේශයන් නියමිත මාසය තුළ වාර්තා කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් ප්‍රකාශය අනුකූලව සකස් කිරීම සඳහා අදාළ

		අංශයෙන් අවශ්‍ය තොරතුරු එක්රැස් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. **(ඇමුණුම 7).**
10.	වසරක් (01) ඉක්මවූ හිඟ ශේෂයන් පියවා නොතිබුණි.	සේවක මරණ, තනතුරු පුරප්පාඩු, තොරතුරු නොමැතිකම වැනි අමාත්‍යාංශයේ පාලනයෙන් ඔබ්බට වසරකට වැඩි කාලයක් තිබූ ශේෂයන් තිබේ. ගෙවා නිදහස් නොවූ ශේෂ ප්‍රමාණයන් අඩු කිරීමට පියවර ගෙන තිබේ වසරකට වඩා වැඩි හිඟ ශේෂ කපා හැරීමට භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ඇත.
11.	අක්‍රිය ගිණුම් සම්බන්ධයෙන් මූල්‍ය රෙගුලාසි 571 අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අමාත්‍යාංශයේ පාලනයෙන් ඔබ්බට (නීතිමය ක්‍රියාමාර්ග, තොරතුරු නොමැතිකම, ප්‍රායෝගික ගැටලු) අක්‍රීය ගිණුම් කිහිපයක් ඉතිරිව ඇත. කෙසේ වෙතත්, අක්‍රීය ගිණුම් නිෂ්කාශනය කිරීමට පියවර ගෙන ඇත. වසර 2කට වැඩි කාලයක් ගෙවා නැති මූල්‍ය ප්‍රමාණයන් මූල්‍ය රෙගුලාසි අනුව රජයේ අදායම් වෙත මාරු කර ඇත.
12.	මූල්‍ය රෙගුලාසි 371 ප්‍රකාරව නිකුත් කරන ලද තත්කාර්ය අතුරු අග්‍රිම මුදල්, කාර්යය නිම කිරීමෙන් මාසයක් ඇතුළත පියවා නැත.	කාර්යයේ ඇති ප්‍රායෝගික අභියෝග සහ ස්වභාවය නිසා, ඇතැම් සිදුවීම් වාර්තා වී ඇත. කෙසේ වෙතත්, මූල්‍ය රෙගුලාසි (FR) සහ අදාළ වක්‍රලේඛ යොමුවලට අනුකූල වීම සහතික කිරීම සඳහා නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. **(ඇමුණුම 8)**
13.	මූල්‍ය රෙගුලාසි 371 අනුව අනුමත සීමාවන් ඉක්මවන තත්කාලීන අතුරු අග්‍රිම මුදල් ප්‍රකාශ නිකුත් කරන ලදී.	නොවැළැක්විය හැකි හේතු නිසා සිදුවීම් කිහිපයක් වාර්තා විය. කෙසේ වෙතත්, මූල්‍ය රෙගුලාසි සහ වක්‍රලේඛ අවශ්‍යතා සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා අවශ්‍ය උපදෙස් නිකුත් කර ඇත. අග්‍රිම මුදල් සීමාව වැඩි කිරීමට සහ අදාළ දුන මණ්ඩල/කාර්යාලවලට උපදෙස් නිකුත් කිරීමට රජයේ භාණ්ඩාගාරයෙන් අනුමැතිය අරගෙන තිබේ. භාණ්ඩාගාරයේ අනුමැතිය දුන් ලිපිය සඳහා **(ඇමුණුම 9)**
14.	අනුමත සීමාවන් ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන / අනුයුක්ත කර නිබුණි.	අනුමත සීමාවන් තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම දුෂ්කර වී ඇත්තේ මෙම අමාත්‍යාංශයට දුන මණ්ඩල තනතුරුවලින් ආපසු පැමිණෙන නිලධාරීන් සහ දුන මණ්ඩලයට අනුයුක්ත කිරීමට නියමිත නිලධාරීන් යම් කාල සීමාවක් සඳහා රඳවා ගැනීමට අවශ්‍ය වන බැවිනි. අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාවට අනුව අධ්‍යක්ෂ ජනරාල් තනතුරු නවයක් (09) සහ එක් (1) තනතුරක් ශ්‍රී ලංකා විදේශ සේවයේ **I ශ්‍රේණියේ** නිලධාරීන් සඳහා ස්ථාපිත කර ඇත. ඉහත

		අනුමත තනතුරු දහයේ (10) ප්‍රතිශතය ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා අනුමත මුළු තනතුරු 264න් 3.8%ක් වන අතර එය සැලකිය යුතු තරම් අඩු අගයකි. විදේශ රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යන ද්විපාර්ශ්වික සබඳතා අඛණ්ඩව වර්ධනය වීමත් සමඟ අමාත්‍යාංශයේ විෂය පථය ද පුළුල් වී ඇත. එම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා ශක්තිමත් කිරීමට සහ ප්‍රතිපත්තිමය තීරණ සංවර්ධනය කිරීමට, විදේශ සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස පත් කළ යුතුය. එසේම, විදේශ රටවල් සහ විදේශ තානාපති කාර්යාල සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සාකච්ඡා මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන සුවිශේෂී කාර්යයක් වන අතර, සමාන ධාරිතාවයකින් යුතු අනුකූල ප්‍රාදේශීය කාර්යයන් සම්බන්දයෙන් අදාළ විශේෂිත අංශයන් භාරව විදේශ සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ව මෙම අමාත්‍යාංශය විසින් පත් කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, එවැනි නිල අවශ්‍යතා සහ අනෙකුත් ජාත්‍යන්තර හා දේශීය කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමේ අරමුණින් දෙපාර්තමේන්තුවලට සිය රාජ්‍යතාන්ත්‍රික කටයුතු සාර්ථකව කරගෙන යාමට හැකිවන පරිදි ශ්‍රී ලංකා විදේශ සේවයේ **පළමුවැනි ශ්‍රේණියේ** නිලධාරීන් අතරින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ සෙසු සමාන්තර සේවා/අමාත්‍යාංශ මෙන් නොව, ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් මෙම අමාත්‍යාංශයට පමණක් සීමා නොවී විදේශ දූත මණ්ඩලවලටද අනුයුක්ත කෙරේ. එසේම මෙම අමාත්‍යාංශයේ ප්‍රමාණවත් තනතුරු ප්‍රමාණයක් නොමැතිකම හේතුවෙන් විදේශ සේවාවන් නිමවා අමාත්‍යාංශයේ සේවයට වාර්තා කරන නිලධාරීන් සේවා ජ්‍යෙෂ්ඨත්වයට අනුව වැදගත් තනතුරුවලට පත්කිරීමද අපහසුය. තවද, අතිගරු ජනාධිපතිතුමාගේ නියෝජිතයා ලෙස විදේශයන්හි ශ්‍රී ලංකාව නියෝජනය කරන තානාපති/මහ කොමසාරිස් වැනි ගෞරවනීය තනතුරක සේවය කර නැවත දිවයිනට පැමිණෙන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවම වශයෙන් අංශයක් භාර අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ සේවය කළ යුතු බව සඳහන් කළ යුතුය. අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ආසන්නතම පහළ මට්ටමේ ඇති තනතුර මධ්‍යම මට්ටමේ (II ශ්‍රේණියේ) අධ්‍යක්ෂ තනතුරක් වන අතර, උසස් තනතුරු පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කරනු ලැබූ තානාපතිවරයෙකු/මහ කොමසාරිස්වරයෙකු ලෙස සේවය කර ඇති නිලධාරියෙකු අධ්‍යක්ෂ තනතුරකට පත් කළ නොහැක. අමාත්‍යාංශය විසින් මේ වන විට කළමනාකරණ සේවා

		දෙපාර්තමේන්තුව සමඟ කතිකා කරමින් සිටී. 2019 වසරේ සිට අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා විදේශ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අවසර ලත් තනතුරු සංඛ්‍යාව වැඩිකරමින් ඉහත පත්වීම් විධිමත් කිරීමට අමාත්‍යාංශය මේ වන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් (DMS) ඉල්ලීම් කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා : අංක 79
ආයතනයේ නම : විදේශ කටයුතු අමාත්‍යාංශය

<u>දෙවන කොටස: **57.00**</u>

	කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු සඳහා පැහැදිලි කිරීම සහ එම අඩුපාඩු/වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
01.	ආයතනය තම විෂය පථයට අදාළ තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට අපොහොසත් වී ඇත.	විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන අරමුණු වලට සම්බන්ධ කිසිදු ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ නැත. අමාත්‍යාංශය අතිගරු අග්‍රාමාත්‍යතුමාගේ ලේකම් විසින් මුලසුන දරන තිරසාර සංවර්ධන පිළිබඳ ජාතික කමිටුවේ සාමාජිකයෙකු වේ. තිරසාර සංවර්ධනය සමඟ සමාන්තරව යන ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ප්‍රමුඛතාවයන් පෙන්වන 2023 – 2027 සඳහා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සහයෝගිතා රාමුව (UNSDCF) සහ තිරසාර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යායපත්‍රය දියත් කිරීමේදී අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශය සමඟ එකතු වී කටයුතු කරන ලදි. අමාත්‍යාංශය විසින් මෙම ප්‍රමුඛතාවන්ට සහයක් ලෙස රජයේ පාර්ශවයන් සහ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන අවශ්‍ය පරිදි සම්බන්ධ කිරීමට පහසුකම් සපයයි.
02.	හඳුනාගත් තිරසාර ඉලක්ක සපුරා ගැනීම සඳහා ළඟා විය යුතු අරමුණු තීරණය කර නොතිබුණි.	
03.	තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක සකසා නොතිබුණි.	අදාළ රජයේ පාර්ශ්වකරුවන් සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සමඟ සාකච්ඡා කර වාර්තා කිරීමේ වගකීම් ඉටු කිරීමේ සම්බන්ධීකරණ කාර්යභාරයක්ද අමාත්‍යාංශය සතු වේ. ජාත්‍යන්තර මට්ටමින් තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය ප්‍රදර්ශණය කිරීමේ අරමුණින් තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ බහුපාර්ශ්වික සම්මන්ත්‍රණවල ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සඳහා අමාත්‍යාංශය සැලකිය යුතු ලෙස පහසුකම් සපයයි. තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ තිරසාර සංවර්ධන කවුන්සිලයටද අමාත්‍යාංශය විසින් උපදේශන සපයනු ලබයි.
04.	සමස්ත කාර්ය මණ්ඩලයම ආවරණය වන පරිදි කාර්ය සාධන ගිවිසුම් කෙටුම්පත් කර හෝ ඇතුළත් කර නොතිබුණි.	කනගාටුවට කරුණක් ලෙස, දැනුවත්භාවය නොමැතිකම හේතුවෙන් සියලුම කාර්ය මණ්ඩලයට කාර්ය සාධන ගිවිසුම් ලබා දීමට අමාත්‍යාංශයට නොහැකි විය. කෙසේ වෙතත්, ආයතනයේ සමස්ත කාර්ය සාධනය ඉහළ නැංවීමේ අරමුණින් මෙම ගිවිසුම් මීළඟ කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීම සහතික කිරීමට

		අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගනු ඇත.
05.	සැලසුම් කර ඇති පුහුණු අවස්ථා අතරින්, ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු විය.	2022.04.26 දිනැති අංක 03/2022 චක්‍රලේඛයට අනුව පුහුණු වැඩසටහන් සඳහා වෙන් කර තිබූ අරමුදල් සීමිත වීම.
06.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ ව්‍යාචන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	රෙගුලාසිවලට අනුකූල නොවීම සහ ප්‍රමාණවත් සාක්ෂි නොමැතිකම හේතුවෙන් 2022 දී තත්වාගණනය කළ මතයක් අමාත්‍යාංශයට වාර්තා කරන ලදී. කෙසේ වෙතත්, 2023 සඳහා ජාතික විගණන කාර්යාලයෙන් අමාත්‍යාංශයට තත්ත්වාගණනය නොකළ මතයක් ලැබී ඇත **(ඇමුණුම 10).**
07.	රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ /නියෝග ක්‍රියාත්මක කර නොනිබුණි.	COPA විසින් ලබා දෙන උපදෙස් බොහෝ අංශවලට මෙන්ම විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට සම්බන්ධ වේ. එබැවින් එම උපදෙස් ක්‍රියාත්මක කිරීමට කාලයක් ගත විය. කෙසේ වෙතත්, දිගු ක්‍රියාවලියකින් පසු අමාත්‍යාංශයට බොහෝ උපදෙස් ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර අද වන විට ඉන් එකක් පමණක් ඉතිරිව ඇත.
08.	සියලුම රාජ්‍ය නිලධාරීන් තම වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොනිබුණි.	1988 අංක 74 දරන පනතෙන් සංශෝධනය වන 1975 අංක 01 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනතට අනුව 2022 වර්ෂයට අදාළව නිලධාරීන් 183 දෙනෙකු වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.
09.	මූල්‍ය රෙගුලාසි 156 (1) ප්‍රකාරව නිලධාරීන් විසින් රජයට සිදුවූ පාඩුව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොනිබුණි.	අධිකාරිය විසින් ලබා දී ඇති මගපෙන්වීම් මත අදාළ නිළධාරීන්ගෙන් රජයට සිදු වී ඇති අලාභ අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව රු 1,237,525.97 ක ප්‍රමාණයක් සහ රු 332,561.23 ක ප්‍රමාණයක් 2023 වසරේදී සහ 2024 වසරේදී අයකරගෙන නිබේ.
10.	මූල්‍ය රෙගුලාසි 119 ප්‍රකාරව ගෙවීමට නියම කරන ලද අධිඅය අයකර ගෙන නොනිබුණි.	අධිකාරිය විසින් ලබා දී ඇති මගපෙන්වීම් මත අදාළ නිළධාරීන්ගෙන් අධිඅය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන ඇත. එම නිසා 2023 වසරේදී රු 546,112.10 ක මුදලක් ගාස්තුවලින් අඩුකර ඇත.
11.	උපරිම සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරීන්ට නිසි ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කර නොනිබුණි.	මෙම අමාත්‍යාංශය කාර්යාල කාර්ය සහයකයන් සහ රියදුරන් සඳහා පමණක් ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස නියම කර ඇත. එම කාණ්ඩවල නිලධාරීන් සඳහා සෑම විටම ස්ථාන මාරු ලබාදෙන ලද්දේ උපරිම සේවා අවශ්‍යතාවයෙන් පසුවය. සේවා අවශ්‍යතා මත වෙනත් කාණ්ඩවල නිලධාරීන් කිහිප දෙනෙකු සේවයේ රඳවාගෙන ඇත.

එම්.යූ.එම්.අලි සබ්රි, ජනාධිපති නීතිඥ, (පා.ම)

විදේශ කටයුතු අමාත්‍ය සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය